(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 51.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 නොවැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵලය කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ තිබෙන ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ට ආහාර වේලක් ලබා දීමට සහ ඉගැන්වීම් කටයුතු කරන පාලිකාවන්ට වැටුපක් ලබාදීමට වර්තමාන රජය කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0547/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ පුදුමින්කට්ටු පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0630/'10

4\.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.07.20 වැනි දින වන විට මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් ලිං කැණීමේ කටයුතුවල තත්වය කවරේද;

(ii) ඉන්දියාවේ කෙයාර්න් සමාගම සමග ඇති කරගත් තෙල් ලිං කැණීම සඳහා වන ගිවිසුම කුමක්ද;

(iii) එම ගිවිසුමට අනුව ගවේෂණය කළ මුළු භූමියෙන් කෙයාර්න් සමාගමට ලබාදුන් භූමි ප්‍රමාණය කවරේද;

(iv) එකී ගිවිසුමට අනුව එම සමාගම කැණීම් අවසන් කළ යුතු දිනය කවරේද;

(v) නියමිත දිනට කැණීම් කටයුතු අවසන් නොකරන්නේ නම්, ගිවිසුමට අනුව ගන්නා ක්‍රියා මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැණීම් කටයුතු සිදුකරන කොන්ත්‍රාත් සමාගමේ ගිණුම් කටයුතු ලංකා රජය යටතේ සිදුකරන්නේද;

(ii) එසේ නම්, අදාළ ගිවිසුමට එළඹි දිනයේ සිට 2010.07.20 වන දිනට ගිණුම් වාර්තා සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එකී ගිණුම් වාර්තා සමාලෝචනය සඳහා ලංකාවේ වගකියන ආයතනයක් තිබේද;

(iv) එසේ නම්, එහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0643/'10

5\.

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත සෞන්දර්ය උපාධිධාරීන්ට රැකියා ලබාදීමට වැඩ පිළිවෙළක් මේ වන විට සකසා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහනින් රැකියා ලබා දීමට අපේක්ෂිත සෞන්දර්ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) බඳවා ගැනීමට අදාළ දැන්වීම් ප්‍රසිද්ධකර, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා තිබේද;

(iv) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් රැකියා ලබා දෙන සංඛ්‍යාව කොපමණද;

(vi) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0758/'10

6\.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ මහ රෝහලේ නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ වැඩ අවසන් කර රෝහල් අධිකාරියට භාර දී තිබේද;

(ii) මෙම නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(iii) එම වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් අවසන්ව ඇත්නම්, එය විවෘත කිරීම මේ දක්වා ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iv) මෙම නව ගොඩනැගිල්ල කඩිනමින් විවෘත කිරීම සඳහා පියවර ගන්නේද;

(v) එසේ නම්, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණය ඉදිකිරීම සඳහා සහ වායු සමීකරණ හා අනෙකුත් මූලික උපාංග සවිකිරීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0761/'10

7\.

ගරු තිස්ස අත්තනායක මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් VOIP අන්තර්ජාතික දුරකථන සේවාවන් සම්බන්ධයෙන් ටෙලිකොම් ඒෂියා සමාගම සමග ගිවිසුමකට එළඹුනේද;

(ii) ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබුනේද;

(iii) එම ගිවිසුමට එළඹීමට පෙර අන්තර්ජාතික දුරකථන ඇමතුම් වෙනුවෙන් විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.075ක මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ලැබුනේද;

(iv) එම ගිවිසුම නිසා ඉහත මුදල විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.069 දක්වා අඩු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම සමඟ ගිවිසුමට එළඹෙන ලෙස වර්ෂ 2009 සැප්තැම්බර් මස දී මුල්වරට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව නීතිමය හා මූල්‍යමය කරුණු මත ප්‍රතික්ෂේප කළේද;

(iii) එසේ නම්, එම සමාගම ශ්‍රී ලංකාවට නැවත ගෙන්වනු ලැබුවේ කවුරුන්ද;

(iv) එම ගිවිසුම අත්සන් කර ඇත්තේ අදාළ සාමාන්‍ය කාර්ය පටිපාටියට පටහැනිවද;

(v) එම ගිවිසුම අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0482/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාව අවසන් වරට තේරී පත්වූයේ කවදාද;

(ii) අවසන් වරට තේරී පත්වූ හෝ නම් කරනු ලැබූ නගරාධිපතිවරයාගේ හා නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොළඹ මහ නගර සභාවට විශේෂ කොමසාරිස්වරයෙකු පත්කරනු ලැබුවේ කවදාද;

(ii) දූෂණ හේතුවෙන් සභාව ක්‍රියාත්මකවීම අත්හිටුවන ලද්දේ කවදාද;

(iii) ඒ පිළිබඳ වාර්තාව ප්‍රධාන අමාත්‍යවරයාට ලබාදෙන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ මහ නගර සභාවට අදාළ චෝදනා පත්‍රය හා චෝදනා පිළිබඳ සොයාගත් තොරතුරු අඩංගු කමිටු වාර්තාව සභාගත කරන්නේද;

(ii) විශේෂ කොමසාරිස්වරයෙකු පත්කරනු වෙනුවට මැතිවරණයක් පැවැත්වීම සඳහා කටයුතු කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට හැකියාවක් නොතිබුණේද;

(iii) නාගරික මන්ත්‍රීවරුන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0496/'10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළදරුවන්ගේ පෝෂණ මට්ටම පිළිබඳව ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම සංඛ්‍යාලේඛන අනුව, ළදරුවන්ගේ පෝෂණ මට්ටම සතුටුදායක තත්වයක පවතින්නේද;

(iii) එම ළදරුවන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0548/'10

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ඉරක්කන්ඩි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0631/'10

11.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ දකුණු අක්වෙරළේ අවසාධිත ද්‍රෝණි 2 හි ඛනිජ තෙල් පැවැතීම සම්බන්ධව කරන ලද පර්යේෂණයන්හි ප්‍රතිඵල කවරේද;

(ii) එම පර්යේෂණයේ ලිඛිත තොරතුරු / සටහන් ඇත්නම් ඉදිරිපත් කරන්නේද;

(iii) එම පර්යේෂණ සම්බන්ධයෙන් වගකියන ආයතනය හෝ එකී වගකීම පැවරූ ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය විසින් ලබාදුන් තොරතුරුවල වගකීම දරන ලංකාවේ විද්‍යාඥයින් සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම දකුණු වෙරළේ ඛනිජ තෙල් සම්බන්ධයෙන් ඉන්දියාව හෝ වෙනත් රටක් සමග ගිවිසුම් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එය මේ සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඉන්දියාව හෝ වෙනත් රටක් සමග ගිවිසුමක් අත්සන් කිරීමට රජය තීරණය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0483/’10

12.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළි කසළ එකතු කිරීම සඳහා කොළඹ මහ නගර සභාව විසින් දිනකට වැයකරන මුළු මුදල කොපමණද;

(ii) දිනකට එකතු කරන කැළි කසළ ටොන් සංඛ්‍යාව කොපමණද;

(iii) කැළි කසළ එකතු කිරීමේදී ටොන් එකක් සඳහා අය කරනු ලබන මුදල කොපමණද;

(iv) කොළඹ මහ නගර සභාව විසින් කැළි කසළ එකතු කිරීමේ කාර්යය සඳහා සම්බන්ධ කර ගෙන ඇති සමාගම් කවරේද;

(v) කැළි කසළ එකතු කිරීම සහ බැහැර කිරීම සඳහා වන ජාතික සැලැස්ම බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව

(ii) මහරගම නගර සභාව

(iii) මොරටුව මහ නගර සභාව

(iv) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

යන ආයතන විසින්, එම ආයතන සීමා තුළ කැළි කසළ එකතු කිරීම සඳහා වැය කරන මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0497/’10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ වන විට සිටින ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳව ලැබී ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම දත්තයන් අනුව ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය සතුටුදායක මට්මක පවතින්නේද;

(iii) එම ගැබිනි මව්වරුන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද?;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/'10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ රලිතුලායි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0633/'10

15.

ගරු අනුර දිසානායක මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු ප්‍රදේශයේ සිටින යුද්ධයෙන් දෙමාපියන් අහිමි වූ දරුවන් සංඛ්‍යාව;

(ii) එම දරුවන් අතර සිටින පාසල් සිසුන් සංඛ්‍යාව;

(iii) ඔවුන්ගෙන් මේ වන විට පාසල් යන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දෙමාපියන් අහිමි වූ ඉහත දරුවන් වෙනුවෙන් සහ ඔවුන් අතරින් පාසල් නොයන දරුවන් වෙනුවෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

ගරු රාජීව විජේසිංහ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (තුන්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2010 නොවැම්බර් 22) [1].

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සහා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදී.)

*8.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*9.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*12.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*13.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

17.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

18.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

[1] "පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.